# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 715 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 26/04/2024 පැය 1605

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.04.25 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 64.75 | - | ප්ලාස්ටික් බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. තීරුබදු නොගෙවා මෙරටට ගෙන්වන ලද විදේශීය දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.04.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කටුනායක පොලිස් වසමේ අමන්දොළුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද විදේශීය දුම්වැටි 600 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කටුනායක වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදුසු 45 ක් වූ කටුනායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කටුනායක විමර්ශන වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර

2024.04.25 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රිදීගම පොලිස් වසමේ රඹබඩගල්ල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 300 ක් හා හෙරොයින් ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 190 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන රිදීගම වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ මොරතිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රිදීගම වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. කසල තේ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොළ කඳවුර

2024.04.25 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නවකුරුඳුවත්ත පොලිස් වසමේ ගම්පොල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මිනිස් පරිභෝජනයට සුදුසු නොවන බවට සැක සහිත රැගෙන ආ කසල තේ කිලෝ 12,981 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන නවකුරුඳුවත්ත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 60 ක් වූ උලපනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. නවකුරුඳුවත්ත** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. කසල තේ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුර

2024.04.25 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල නිලධාරීන්ට ලද තොරතුරක් මත දවුලගල පොලිස් වසමේ ලීමගහකොටුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **වලංගු ගබඩා බලපත්‍රයක් නොමැතිව කසල තේ කිලෝ 14,386 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දවුලගල පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 38 ක් වූ ලීමගහකොටුව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. දවුලගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්ගොඩ කඳවුර.

2024.04.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්ගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්බලන්තොට පොලිස් වසමේ කරඹගල්මුල්ල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්තොට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ රිදීයගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.04.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ යාපනය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මත්කරල් 1,400 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. බලපත්‍ර නොමැතිව කපා ඉරන ලද විවිධ ප්‍රමාණයේ ලී කඳන් තොගයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.**

2024.04.25 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කිලිනොච්චිය පොලිස් වසමේ 264 කිලෝ මීටර් කණුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව විශ්වමඩු රක්ෂිත ප්‍රදේශයෙන් කපා ඉරන ලද විවිධ ප්‍රමාණයේ ඉරන ලද පළු ලී කඳන් 263 ක් හා ලොරි රථයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 වයස් වල පසුවන ධර්මපුරම් හා විශ්වමඩු ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**